# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1905/4 - 2015 මාර්තු මස 09 වැනි සඳුදා - 2015.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 ජනවාරි මස 18 වැනි දිනැති අංක 1897/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය, පහත උපලේඛනයෙහි සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන
ජනාධිපති

2015 මාර්තු මස 06 වැනි දින
කොළඹ 01
ජනාධිපති කාර්යාලය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය (අංක 4) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 18 සහ 19 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ;

18. පුද්ගලයින් ලියාපදිංචි කිරීම
19. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
20. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 8 අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

9. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13)" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)

(2) එම නිවේදනයෙහි ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය (අංක 5) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 3 වන අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි 3 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)" ඉවත් කිරීමෙන් ;

(3) එම නිවේදනයෙහි ආහාර සුරක්ෂිතතාව අමාත්‍ය (අංක 6) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 2 සහ 4 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 3, 5, 6 සහ 7 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ;

2. ආහාර සහ සෙසු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සහතික කිරීම
3. සාධාරණ මිලකට කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම සහතික කිරීම
4. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
5. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

(ඇ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 6, 8, 9 සහ 10 අයිතමයන් ඉවත් කිරීමෙන් :-

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 7, 11 සහ 12 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ;

6. ජාතික සමූපකාර සංවර්ධන ආයතනය
7. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන
8. වී අලෙවි මණ්ඩලය

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමයන් ඉවත් කිරීමෙන් :-

* පාරිභෝගික කටයුතු අධිකාරිය පනත (2003 අංක 9)
* පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත (1979 අංක 1)
* සමූපකාර තොග වෙළඳ සංස්ථා පනත

(4) එම නිවේදනයෙහි රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය (අංක 8) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 5 වන අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි 1 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(5) එම නිවේදනයෙහි මුදල් අමාත්‍ය (අංක 11) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 17 සහ 18 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ;

17. සේවක සංඛ්‍යා කළමනාකරණය හා වැටුප් නියම කිරීම පිළිබඳ උපදේශක සේවා
18. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
19. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 35 අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

36. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
37. බදු අභියාචනා කොමිෂන් සභාව

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "පරිසර සංරක්ෂණ බදු පනත (2008 අංක 26)" යන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

* බදු අභියාචනා කොමිෂන් සභාව පනත (2008 අංක 23)

(6) එම නිවේදනයෙහි සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය (අංක 14) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 24 අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

25. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

(7) එම නිවේදනයෙහි නිවාස හා සමෘද්ධි අමාත්‍ය (අංක 18) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 15 අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

16. ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය ;

(8) එම නිවේදනයෙහි සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය (අංක 21) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 8 සහ 12 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 9, 10, 11 සහ 13 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ;

8. ක්‍රීඩා කටයුතු දිරිගැන්වීම
9. ක්‍රීඩා පහසුකම් සංවර්ධනය
10. ක්‍රීඩා අධ්‍යාපනය
11. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

(ඇ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 9, 10 සහ 11 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 12 සිට 17 දක්වා අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ;

9. අපේගම
10. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
11. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
12. ජාතික ක්‍රීඩා විද්‍යායතනය
13. ජාතික ක්‍රීඩා සභාව
14. ක්‍රීඩා වෛද්‍ය ආයතනය
15. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

* ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35)

* ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4)

(ඊ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරි පනත (1999 අංක 17) " යන අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

* 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත

(9) එම නිවේදනයෙහි කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය (අංක 23) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම නිවේදනයෙහි I වැනි තීරුවෙහි දැක්වෙන 11 සහ 12 අයිතමයන් වෙනුවට පහත අයිතමයන් ආදේශ කිරීමෙන් ;

11. ජාතික ශිල්ප හා කලා සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම
12. ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා මෝස්තර සංවර්ධනය හා ප්‍රචලිත කිරීම
13. පාරිභෝගික භාණ්ඩවලට අදාළ වන ජාතික මිල ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවෙහි යෙදීම
14. පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම
15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්
16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

(ආ) එම නිවේදනයෙහි II වැනි තීරුවෙහි දැක්වෙන 32 අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

33. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)
34. ජාතික මෝස්තර මධ්‍යස්ථානය
35. ජාතික ශිල්ප සභාව
36. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
37. සීමාසහිත ලංකා සතොස
38. සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩිං සමාගම
39. සමූපකාර තොග වෙළඳ සංස්ථාව

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන ''ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම් පනත (1979 අංක 53)'' යන අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

* ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35)
* ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 4)
* පාරිභෝගික කටයුතු අධිකාරිය පනත (2003 අංක 9)
* පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ පනත (1979 අංක 1)
* සමූපකාර තොග වෙළඳ සංස්ථා පනත

(10) එම නිවේදනයෙහි අධ්‍යාපන අමාත්‍ය (අංක 26) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 11 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන ''ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත (1991 අංක 19)'' ඉවත් කිරීමෙන්.

03 - 661

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.